# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 236/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 09/02/2024<br>පැය 1415 |

## මාධ්‍ය නිවේදනය

**01. දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිදුවූ අනතුරක් සම්බන්ධව - සූරිය වැව පොලිස් වසම.**

2024.02.09 වන දින උදෑසන කාලයේ සූරියවැව පොලිස් වසමේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ 196.4 එල් ස්ථානයේදි කොළඹ සිට මත්තල දෙසට ගමන් ගත් ලොරි රථයක පිටුපසින් ගමන් ගත් වෑන් රථයක් ගැටි අනතුරක් සිදුවී ඇත.

**අනතුරින් රථයේ රියදුරු, විදේශික ජාතිකයින් සිව්දෙනෙකු හා මගපෙන්නා තුවාල ලබා හම්බන්තොට රෝහලට ඇතුලත් කර ඇත.**

මෙම විදේශියින් අතර පිරිමි පුද්ගලයෙකුද, කාන්තාවක් දෙදෙනෙකුද හා කුඩා ගැහැණු දරුවකුද සිටින අතර මොවුන් අවුරුදු 41,64, 37 හා 08 වයස් වල පසුවන රුසියන් ජාතිකයන් බවට තොරතුරු අනාවරණය වී ඇත. සූරියවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කිරින්ද පොලිස් වසම.**

2024.02.09 වන දින උදෑසන කාලයේ යාල ආමදුව මාර්ගයේ සෆාරි ජීප් රථයක් ගමන් කර ඇති අතර එහි පිටුපස ගමන් ගත් පුද්ගලයෙකු ජීප් රථයෙන් වැටි අනතුරක් සිදුවී ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ තුවාලකරු කිරින්ද රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. **මරණකරු වයස අවුරුදු 51 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘතශරිරය තිස්සහාරාමය රෝහලේ මෘතශරිරාගාරයේ තැන්පත් කර ඇත. කිරින්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - මදුරන්කුලිය පොලිස් වසම.**

2024.02.09 වන දින උදෑසන කාලයේ මදුරන්කුලිය පොලිස් වසමේ කිලෝමීටර් 110 - 111 කිලෝමීටර් දරණ කණුව ආසන්නයේදී හලාවත සිට පුත්තලම දෙසට ධාවනය වූ

කාර් රථයක් රියදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුවී ඇත.

අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. **මරණකරු වයස අවුරුදු 47 ක් වූ මදුරන්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘතශරීරය පුත්තලම රෝහලේ මෘතශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මදුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**